# පළමුවන වාර පරීක්ෂණය - 2018
# 12 ශ්‍රේණිය
# පෙරදිග සංගීතය - I පත්‍රය

**කාලය : පැය 2යි.**

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

---

◆ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) ධ̣නි̣ , සමග ..... ආදී වශයෙන් ස්වර සංගති යෙදෙන නිර්දේශිත රාගය වන්නේ,

(1) බිහාග් (2) බ්‍රින්දාමනීසාරංග (3) භාගේශ්‍රී
(4) දේශ් (5) කාෆි (......)

(02) ශාස්ත්‍රීය ගායනය පුහුණුවීමේ දී වඩාත්ම සුදුසු අභ්‍යාස,

(1) ශ්වසන අභ්‍යාස (2) වාදන අභ්‍යාස (3) ශාරීරික අභ්‍යාස
(4) දත් සම්බන්ධ අභ්‍යාස (5) හස්ත අභ්‍යාස (......)

(03) ශාස්ත්‍රීය ගායනයක් ඉදිරිපත් කිරීමේදී ඊට සහය සඳහා යොදා ගැනීමට ඉතාම සුදුසු භාණ්ඩ යුගලය වන්නේ,

(1) සර්පිනාව - තබ්ලාව (2) සර්පිනාව - තාම්පුරාව
(3) තාම්පුරාව - තබ්ලාව (4) වයලීනය - තබ්ලාව
(5) තාම්පුරාව - වයලීනය (......)

(04) රාගධාරී ගීතයක් ගායනය කිරීමේ දී නිවැරදි ඉරියව්වක් වන්නේ,

(1) පිට කොන්ද තමාට රිසිසේ තබාගෙන ගායනය කිරීම.
(2) ස්වරාලයේ ක්‍රියාකාරීත්වය අවහිර නොවන සේ මුහුණ කෙළින් තබා ගායනය
(3) මානසික ඒකාග්‍රතාවයකින් තොරව ගායනය
(4) ඕනෑම පහසු ඉරියව්වකින් අසුන්ගෙන ගායනය
(5) නැගී සිට රාගය ගායනය කිරීම. (......)

(05) රාග විස්තර හඳුනාගත හැකි ගායන විශේෂ වන්නේ,

(1) සර්ගම් ගී (2) වර්ණම් ගී (3) ලක්ෂණ ගී
(4) ස්වර මාලිකා (5) ඛ්‍යාල් ගී (......)

(06) ස නි̣ ස ......... ස නි̣ ධ̣ ප̣ ධ̣ නි̣ ස මෙහි හිස්තැනට සුදුසු ස්වර ඛණ්ඩය වන්නේ,

(1) ස නි̣ ප̣ නි̣ ස (2) ස රි ස නි̣ ප̣ නි̣ ස (3) ස නි̣ ප̣ ධ̣ නි̣ ස
(4) ස නි̣ ධ̣ නි̣ ස (5) ස නි̣ ධ̣ ප̣ ම̣ ප̣ ධ̣ නි̣ ස (......)

(07) ගායනයේ දී ශ්‍රැතිය පවත්වා ගැනීම සඳහා යොදාගන්නා තත් වාද්‍ය භාණ්ඩය වන්නේ,

(1) වයලීනය (2) සර්පිනාව (3) සිතාරය
(4) තබ්ලාව (5) තාම්පුරාව (......)

(08) ''හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා ද, රමණීය නාද රූප බිහිකිරීම සඳහා ද, නාදයන් සංයෝජනය කිරීමේදී කාලව සංගීතයයි'' යනුවෙන් පැවසූයේ,

(1) ප්‍රේමවංශ හපුවලාන ශූරීන් (2) සී ද ඇස් කුලතිලක ශූරීන්

(3) විමල් අභය සුන්දර මහතා (4) බී.එස්. විජේරත්න මහතා

(5) සාරංග දේව පණ්ඩිතුමා ( )

(09) ගානසමය සිද්ධාන්තය අනුව උදය සන්ධි ප්‍රකාශ සමය වන්නේ,

(1) පෙ.ව. 4.00 - 7.00 දක්වා (2) රාත්‍රී 10.00 - පෙ.ව. 6.00 දක්වා කාලය

(3) පෙ.ව. 7.00 - රාත්‍රී 7.00 දක්වා (4) පෙ.ව. 6.00 - ප.ව. 6.00 දක්වා

(5) රාත්‍රී 7.00 - පෙ.ව. 4.00 දක්වා ( )

(10) සමය දර්ශක ස්වරය නොහොත් අද්ව දර්ශක ස්වරය යනු,

(1) ෂඩ්ජය (2) රිෂභය (3) ගාන්ධාරය

(4) මධ්‍යමය (5) පංචමය ( )

(11) සන්ධි ප්‍රකාශ රාග වලට පොදු ලක්ෂණයකි.

(1) ශුද්ධ මධ්‍යමය පමණක් යෙදීම.

(2) තීව්‍ර මධ්‍යමය පමණක් යෙදීම.

(3) රිෂභය හා ධෛවතය කෝමලව යෙදීම.

(4) රිෂභය කෝමලවත් ධෛවතය ශුද්ධවත් යෙදීම.

(5) රිෂභය ශුද්ධවත් ධෛවතය කෝමලවත් යෙදීම. ( )

(12) දේශීය තිත් ක්‍රමයට අනුව දෙතිතට අයත් තිත් ප්‍රභේද දෙකකට අදාළව මාත්‍රා බෙදෙන හින්දුස්ථානී තාල යුගලය වන්නේ,

(1) ඣප් තාල - ත්‍රිතාල් (2) ත්‍රිතාල් - දීප්චන්දි

(3) දාදරා - ඣප් තාල් (4) ඣප් තාල් - දීප්චන්දි

(5) රූපක් - ත්‍රීතාල් ( )

(13) ශාස්ත්‍රීය සංගීතයේ දී රාගයට ප්‍රවිශ්ට වීම සඳහා යොදාගනු ලබන ගායන / වාදන අංගයකි.

(1) තාන අලංකාර (2) ගමක් (3) මීන්ඩ්

(4) ආලාප (5) මුර්කි ( )

(14) විශ්ව සංගීතයේ පිළිගත් සංගීත පද්ධති ගණන,

(1) 2 කි. (2) 3 කි. (3) 1 කි. (4) 4 කි. (5) 5 කි. ( )

(15) "F" Major Scale යට (ස්කේලයට) අයත් ස්වර,

(1) පධනිසරිගම'ප (2) මපධනිසරිගම (3) මපධනිසරිගම

(4) ම'පධනිසරිගම' (5) පධනිසරිගම'ප ( )

(16) සරල ගීත වලින්, රාගාශ්‍රිත සරල ගීතයක් වෙන්කොට ගත හැකි ලක්ෂණය වන්නේ,

(1) පෙර වාදන අතුරු වාදන තිබීම. (2) ස්ථායි, අන්තරා ආකෘතිය තිබීම.

(3) රාගධාරී ශිල්ප ක්‍රම භාවිතා කිරීම. (4) තබ්ලා අක්ෂර ගැයීම.

(5) Bits, Counter Points භාවිතය. ( )

17. තබ්ලාවේ බයාන් කොටසින් පමණක් වැයීමට හැකි අක්ෂරයකි.

(1) තිට (2) ධිං (3) තුං (4) ධා (5) ගෙ (.......)

(18) ඣප් තාලයට අනුව ගායනා කළ හැකි ගීතයකි.

(1) කවුරුදෝ අර කවුළුවෙන් (2) දුරස්වන්නට මේ ලෙසින්
(3) පිපී පිපී රේණු නටන (4) ඔබයි රම්‍ය සඳ කිරණ
(5) නින්ද නේන රාත්‍රියේ (.......)

(19) ශාස්ත්‍රීය ගායනයකදී ගීතයේ වචන භාවිතා කරමින් ආලාප ගායනය කිරීම,

(1) ස්ථායි ආලාප (2) 'ආ' කාරාදී ආලාප (3) බඩත් ආලාප
(4) නෝම් - තෝම් ආලාප (5) බෝල් ආලාප (.......)

(20) " 'G' Major Chord" එකට අයත් ස්වර වන්නේ,

(1) ස ග ප (2) ප නි̣ රි̇ (3) ම ධ ස̇
(4) ප නි රි̇ (5) රි̇ නි ස̇ (.......)

(21) ආදිවාසීන්ගෙන් පැවත එන ගී විශේෂයකි.

(1) මෙහෙ ගී (2) ගැල් ගී (3) වැදි ගී
(4) පතල් ගී (5) ටීකා සීපද (.......)

(22) ගැමි ගී නිර්මාණයට පදනම් වූ මූලික කාරණා තුන වන්නේ,

(1) ඇදහිලි විශ්වාසය, සමාජයීය අවශ්‍යතා, පාරිසරික සාධක
(2) විවිධ වෘත්තීන්, සමාජීය සාධක, විද්‍යාත්මක සාධක
(3) සමාජීය අවශ්‍යතා, පාරිසරික සාධක, භෞතික සාධක
(4) භෞතික සාධක, පාරිසරික සාධක, විද්‍යාත්මක සාධක
(5) විවිධ වෘත්තීන්, ඇදහිලි විශ්වාස, සමාජීය අවශ්‍යතා (.......)

(23) ගීතයක හෝ තබ්ලා වාදනයක එක් කොටසක් තෙවරක් ගායනය / වාදනය කරමින් සමස්ථානයට පැමිණීම හඳුන්වන්නේ,

(1) මුඛඩා (2) කජලා (3) තිහායි (4) උපජ් (5) චක්‍රදාර් (.......)

24. තබ්ලාවෙන් ''ධිං'' අක්ෂරය නිපදවන්නේ,

(1) බායාවේ ගෙ සහ දායාවේ න වැයීමෙන්
(2) බායාවේ ගෙ සහ දායාවේ තිං වැයීමෙන්
(3) බායාවේ ක සහ දායාවේ තිං වැයීමෙන්
(4) බායාවේ ක සහ දායාවේ න වැයීමෙන්
(5) බායාවේ ගෙ සහ දායාවේ තුං වැයීමෙන් (.......)

(25) උත්තර භාරතීය සහ දක්ෂිණ භාරතීය සංගීත පද්ධති සඳහා වන පොදු ලක්ෂණයකි.

(1) මේල සංඛ්‍යාව සමානවීම
(2) ගීත ආකෘතිය සමානවීම
(3) ශුද්ධ හා විකෘති ස්වර 12 බැගින් යෙදීම
(4) ස්වර උච්චාරණය සහ සංගීත ධ්වනි එකිනෙකට සමාන වීම
(5) තාල සංඛ්‍යාව සමාන වීම (.......)

* **අංක 26 සිට 50 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

(26) හින්දුස්ථානි තාල පදයක් වන දීප්චන්දි තාලයට සමාන වන දේශීය තිත ....................................... යි.

(27) සගරිමග, රිමපගම .......................................... යන ස්වර අභ්‍යාසයේ තෙවන ස්වර ඛණ්ඩය (හිස්තැන) සම්පූර්ණ කරන්න.

(28) රාගයක් වීමට අවම වශයෙන් ස්වර .................................................. අඩංගු විය යුතුය.

(29) Dotted Minim එක මුළු වටිනාකම ........................................... කි.

(30) භාගේශ්‍රී රාගය ................................................. මේලයෙන් උපදී.

(31) එම රාගය ගැයීමට සුදුසු කාලය හෙවත් ගානසමය ........................................................... ප්‍රහරයයි.

(32) සප්තකයේ පශ්චිම භාගයෙහි හෙවත් අවසාන ස්වර අතරේ වාදී ස්වරය පිහිටියේ නම් එය ...................................................... රාගයක් වේ.

(33) රාගධාරී සංගීතයේ මධ්‍යලය ගීතය හා සම්බන්ධ ආලාප ගායනය ................................................. යනුවෙන් හැඳින්වේ.

(34) ගීතයක හෝ වාදිතයක ආරම්භයේ සිට සමස්ථානයට ප්‍රවිශ්ට වන තෙක් ගැයෙන / වැයෙන කොටස .......................................................... නම් වේ.

(35) කාලය මනින මිම්ම මාත්‍රාව නම් වන අතර, තාලයකට ගනු ලබන මාත්‍රා සංඛ්‍යාව ..................................................... නම් වේ.

(36) තාල ප්‍රදර්ශනයේ දී දෑත් වියෝග වන ස්ථානය ................................................... ලෙස හැඳින්වේ.

(37) ''ගීත වාද්‍යං තතා නෘත්‍යං
ත්‍රයං සංගීත මුච්‍යතේ'' යනුවෙන් සඳහන් කොට ඇති සාරංග දේව පඬිවරයා විසින් රචිත ග්‍රන්ථය .......................................................... යි.

(38) බටහිර සංගීතයට අනුව එක් වරකදී ස්වර කීපයක් එකවර ගැයේ / වැයේ. එම සිද්ධාන්තය ................................................... නම් වේ.

(39) පාසල් පද්ධතිය තුළ බෙහෙවින්ම ජනප්‍රිය මෙන්ම එක් එක් රංගයන්ට අදාළව ස්වර ප්‍රස්තාර ද, සරල තාන අලංකාර ද ඇතුළත් කරමින් රචිත ග්‍රන්ථයකි ''භාවික ගීත'' එය රචනා කරන ලද්දේ ...........................................................

(40) ඩබ්.බී. මකුලොලුව මහතා විසින් රචිත ........................................................ කෘතිය, ශ්‍රී ලංකාවේ ජන සංගීත අධ්‍යාපනය පාසල් පද්ධතිය තුළ ව්‍යාප්ත කිරීමට මහත් රුකුලක් වී ඇත.

(41) උතුරු ඉන්දියානු සංගීත භාණ්ඩ අතරින් පර්දා පිහිටීමේ සමාන බවක් දක්වන භාණ්ඩ යුගලය ................................................ හා ............................................... යි.

(42) කර්ණාටක සංගීත පද්ධතියේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ................................................. වේ.

(43) ................................................ පණ්ඩිතුමා විසින් ගාන සමය න්‍යායට අනුව සියලු රාග වර්ග දෙකකට බෙදා කාල නිර්ණය ලොවට හඳුන්වා දෙන ලදී.

(44) එකම ථාටයකින් උපදින, එකම ආකාරයේ ස්වර ප්‍රයෝග වන එකිනෙකට සමාන වූ රාග ............................................... නම් වේ.

(45) රාගයක නිතර ගැයෙන/වැයෙන ප්‍රබල හා ප්‍රධාන ස්වර සංගතිය ............................................. යනුවෙන් හැඳින්වේ.

(46) සිතාර්, වයලීන්, සරෝද්, බටනලා ආදී වාද්‍ය භාණ්ඩවලින් සිදුකරනු ලබන ආලාප ක්‍රමය ................................................... නම් වේ.

(47) සරල ගීයක ගීතය ගායනයට පෙර වාදනය වන සංගීත ඛණ්ඩය ................................................ නම් වේ.

(48) බටහිර සංගීතයේ තාල පද්ධතියේ තාල සලකුණු හෙවත් කාල සලකුණු ක්‍රමය .............................. ...................... යනුවෙනි.

(49) පරන්, තිහාය, රේලා ආදී ශාස්ත්‍රීය කොටස් රස විඳීමට අපට හැකිවන්නේ ................................. වාදනයකදී ය.

(50) තාලාත්මක වූත්, රාගාත්මක වූත්, අර්ථ රසයෙන් තොර වූත්, ගායන විශේෂය .............................. ..................... නම් වේ.

# පළමුවන වාර පරීක්ෂණය - 2018
# 12 ශ්‍රේණිය
# පෙරදිග සංගීතය - II පත්‍රය

**කාලය : පැය 3 යි.**

❖ **I කොටසින් ප්‍රශ්න දෙකකට ද, II කොටසින් එක් ප්‍රශ්නයකට ද, III කොටසින් ප්‍රශ්න දෙකකට ද වශයෙන් ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

---

## I කොටස

(01) (i) භාගේශ්‍රී රාගයේ මේලය, ආරෝහණ, අවරෝහණ, වාදී, සංවාදී, ජාතිය, මුඛ්‍යාංශය, ගානසමය ලියා දක්වන්න. (ල. 8)

(ii) එම රාගයේ මේලයට අයත් ස්වර ලියා දක්වන්න. (ල. 2)

(iii) එම රාගයට අයත් මධ්‍යලය ගීතයක් ස්ථායි අන්තරා වශයෙන් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 5)

(iv) රාගයට අදාල තානාලංකාර 3 ක් මාත්‍රා 8 ට නොඅඩු වන සේ ලියා දක්වන්න. (ල. 2)

(02) තම කටහඬ පාලනයකින් යුතුව ගැයීම ගායකයකු සතුව තිබිය යුතු ගුණාංගයක් ලෙස හඳුන්වයි.

(i) එසේ තම කටහඬ පාලනයකින් යුතුව ගායනා කිරීමෙන් අපට ලැබෙන වාසි 4 ක් ලියා දක්වන්න. (ල. 4)

(ii) මන්ද්‍ර, මධ්‍ය හා උච්ච සප්තක කරා විහිදුන ස්වර අභ්‍යාසයක් නිර්මාණය කරන්න. (ල. 4)

(iii) නිර්දේශිත රාගයේ සර්ගම් ගීතයේ ස්ථායි කොටස පමණක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 4)

(iv) බාගේශ්‍රී රාගයේ විශේෂ ස්වර ඛණ්ඩ 2 ක් ලියා දක්වන්න. (ල. 4)

(v) එම රාගයට අදාල ස්වර 20 ට නොඅඩු වන සේ ආලාපයක් නිර්මාණය කරන්න. (ල. 4)

(03) (i) ගති, මිති, ලය කෙටියෙන් හඳුන්වන්න. (ල. 6)

(ii) මාත්‍රා 6, 10, 14, 16 යන මාත්‍රා සංඛ්‍යාවන්ට අදාල හින්දුස්ථානි තාල නම් කරන්න. (ල. 4)

(iii) ඉහත එක් එක් තාලයක් ප්‍රස්තාර කර එහි කොටස් නම් කරන්න. (ල. 4)

(iv) ජප් තාලය හෝ ත්‍රිතාලය සම දෙගුණ වශයෙන් ප්‍රස්තාර කරන්න. (ල. 6)

## II කොටස

(04) (i) පහත සඳහන් කරුණු අදාළ කරගනිමින් ආදිවාසීන් විසින් ගයන ලද වැදි ගීතවල සංස්කෘතික ලක්ෂණ විමසන්න.

- වැදි ගීතවල භාෂාව හා රිද්මය
- වැදි ගීතවල ස්වර පරාසය
- වැදි ගීතවලට සමාන ලෙසින් නිර්මාණය වී ඇති නූතන සරල ගීත (ල. 8)

(ii) ඔබ දන්නා වැදි ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 4)

(iii) අනාසාතාත්මක මෙහෙ ගී වර්ග 4 ක් නම් කොට ඊට අදාල මුල් පාද ලියා දක්වන්න. (ල. 4)

(iv) සේ ගී වර්ග 4 ක් නම් කොට එම ගීතවලට අදාල මුල් පාද ලියා දක්වන්න. (ල. 4)

(05) ලංකාවේ ගැමි නාට්‍ය ශෛලීන් දෙකක් ලෙස සොකරි හා කෝලම් හැඳින්විය හැක.

(i) සොකරි හා කෝලම් නාට්‍ය ශෛලීන් දෙක පිළිබඳව සංසන්දනාත්මක විග්‍රහයක යෙදෙන්න. (ල. 12)

(ii) සොකරි හා කෝලම් ගීත දෙකක් ලියා දක්වන්න. (ල. 4)

(iii) ගැමි ගීයේ සුවිශේෂී ලක්ෂණ 4 ක් ලියන්න. (ල. 4)

## III කොටස

(06)




(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරන්න. (ල. 8)

(ii) ඉහත අංක 1, 2, 3, 4 සංකේතයන්ගේ නම් ලියා දක්වන්න. (ල. 4)

(iii) අපරදිග ස්වර ප්‍රස්තාරයට අදාල ටයිම් සිග්නේචරය සහ පෙරදිග ස්වර ප්‍රස්තාරයට අදාළ හින්දුස්ථානි තාලයේ නමද ලියන්න. (ල. 4)

(iv) C major සහ G major Chords වලට අදාල ස්වර ලියන්න. (ල. 4)

(07) පහත සඳහන් මාතෘකා අතරින් 4 තෝරාගෙන ඊට අදාළ කෙටි සටහන් ලියන්න.

| | | |
|---|---|---|
| (i) ගායනසමය | (ii) ආලාප | (iii) W.B. මකුලොලුව |
| (iv) සී.ද.එස්. කුලතිලක | (v) සංගීතය | (vi) ජාතිය |

(ල. 5 බැගින්)

(08) (i) රාගධාරී ශාස්ත්‍රීය පදනම සහිත සරල ශාස්ත්‍රීය ගීතයක් ගෙන එහි ඇතුළත් ශාස්ත්‍රීය අංග පිළිබඳ විග්‍රහයක යෙදෙන්න. (ල. 8)

(ii) තබ්ලාවක් ඇඳ එහි කොටස් 6 ක් නම් කරන්න. (ල. 6)

(iii) ශාස්ත්‍රීය තබ්ලා වාදනයක ඇතුලත් කායදා, පල්ටා, මුඛඩා වැනි වාදන ශිල්ප විධි වලින් 2 ක් පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ල. 6)